## කවි කොළය

### හාල්පාරුවෝ

රෝල් අතේ ගසමින් පල් බොරු පට්ට
බා ල් නැටූ අල්ලාගෙන කොටි නැට්ට
සෝල් හයිම් නම් කයිරාටික කට්ට
හා ල් පාරුවාණෙනි කොටි ඇම් බැට්ට

හි ත ව ත් කමක් පා නෑ දෑ කෙනෙකු වගේ
මැ ද හ ත් කරුවෙකුගෙ බැඳ පිරුවටය ඇඟේ
දෙ වි ද ත් තයා වී නූතන මිහිඳු යුගේ
මොනහත් තිලව්වට ආවද රටට මගේ

සජ්ජා යනය කරමින් සාමයෙ ගීත
විජ්ජා පෑව සව්මත් කොට කොටි දෑත
ඉච්චා බස් දෙඩූ රට රවටන බූත
ලජ්ජා සහගතය නුඹෙ මෙහෙවර දූත

ස ර ණා ගත පැනය කරගෙන හිසට කුඩේ
ම ර ණා සන්න කොටි වෙනුවෙන් දුවපු කඩේ
කරුණා නිධිගෙ වයසක දත් හැළුණු නඩේ
එරුණා මෙදා දෙස්පාලන ගොහොරු මඩේ

දිය ලබු ගෙඩිය මෙනි ඇඟපත හැඩ කාර
බිය වම ආ වැඩූ දැක කොටි අව තාර
ජය ලලිතාට මහ ජන්දෙදි මේ පාර
නිය මෙට වැදිණ ජනතා බූවලු පාර

ජ න් දෙට වහල් වී ලන්ඩන් දෙමළ රැලේ
අ න් තිම පැයෙත් කොටි වෙනුවෙනි සටන කළේ
දැන් මිලිබෑන්ඩ් පර සුද්දා වසබ කුලේ
හ මි පඩ බළල් තඩියෙකු මෙනි පැහැරු ගලේ

කොටියා එතැයි ඊළාමය කරා ඇදී
හි ටි යා හිලරි නෝනා විළිරුදා හැදී
පැ ටි යා වදනු බැරිවිය නිසි වෙලා වෙදී
කොටියා වලෙන් නැගිටින තුරු බලා හිඳී

පු ටු වක් අරා සිටි
එක්සත් ජාතින් නේ
ක ටු බැළලිය සමග
කේ පී වැනියන් නේ
හොටු හූරන පිරිස
තව කොතෙකුත් ඉන් නේ
ත ටු හැළිලාය දැන්
ඉගිලෙනු බැහැ උන් නේ

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



## 2 Elamists jailed for rape

## ස්ත්‍රී දූෂණයට හිරේ ගිය කොටි




Jailed LTTE rapists Tharumaseelam Thangavel and Arunan Thanabalasingam

Two Sri Lankan Tamil youth in England, who are supporters of the LTTE have been sentenced to eight and a half years in jail over the rape of a 21 year old girl. A final decision on whether they should be returned to their country of origin will be made by the Home Office.

The victim - a student who had drinks in a pub in Portsmouth met accused there and they offered her a lift to go home. She agreed and got into their car. Instead of dropping her where she lived, the Tamil youths took her to their flat and raped her in turns. Later they were arrested. Tamils claimed they had consensual sex with the woman, and stood trial at Portsmouth Crown Court where they were given 8 and half year jail terms.

එංගලන්තයේ පෝට්ස්මත් උසාවියේ මේ නොබෝදා ඇසුණු ස්ත්‍රී දූෂණ නඩුවකි. කොටි සංවිධානයේ දෙදෙනෙකු වූ ධර්මසීලන් තංගවේල් සහ අරුණන් තනබාලසිංහම් චූදිතයෝ වෙති. දූෂණයට ගොදුරුව ඇත්තේ 21 වියැති සුදු තරුණියකි. ඇයගේ ප්‍රකාශයට අනුව පෝට්ස්මත් හි අවන්හලක ඇය බීම බොමින් සිටියදී කතාවට වැටුණු දෙමළ තරුණයෝ ඇය ගෙදර ගොස් ඇරලන්නට කැමති වූහ. ඇය ඔවුන්ගේ රියට නැගුණාය. එහෙත් ඔවුන් ඇය සිය නිවසට ගෙන ගොස් පිට පිටම දූෂණය කර ඇත. ඔවුන් කිවේ ඇයගේ කැමැත්තෙන් සියල්ල සිදු වූ බවයි. උසාවිය එය පිළිගත්තේ නැත. චූදිතයන් දෙදෙන අවුරුදු අට හමාරකට හිරේට යැවිණ.



## World's shortest war took only 38 minutes

## ලොව කෙටිම යුද්ධයට විනාඩි 38



Zanzibar after war

The shortest war ever was between Britain and Zanzibar and lasted 38 minutes. Zanzibar is an East African country and a part of Tanzania. First it was under Portuguese Empire for 200 years but in 1890 it fell into the hands of the British Empire. Zanzibar became a developed costal country, which paved the way to Arab elite to grow spices and do slave trade. The Sultan who was in charge there became a puppet of the British who ruled the colony from England.

This particular war began when the Sultan of Zanzibar died and his nephew Khalid bin Bargash took control. The British thought he might be trouble and sent the Navy in. Shelling began at 9,02 am on August 27, 1896; after Bargash's fleet of one ship was sunk, he fled.

ලොව මෙතෙක් පැවති යුද්ධ වලින් කෙටිම යුද්ධය වූයේ මහා බ්‍රිතාන්‍යය හා සැන්සිබාර් අතර සටනයි. එය විනාඩි 38 ක් තරම් සුළු කාලයකදී නිම විය. නැගෙනහිර අප්‍රිකාවේ රටක් වන සැන්සිබාර්, ටැන්සානියාවේම කොටසකි. එය මුලින්ම පෘතුගීසි අධිරාජ්‍ය විසින් වසර 200 ක් පාලනය කරන ලදුව පසුව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පාලනයට 1890 දී නතු විය. සැන්සිබාරය පොහොසත් අරාබි නාවිකයන්ගේ පාරාදීසයක් විය. එහි කුළුබඩු වෙළඳාම සහ වහල් වෙළඳාම ඉතා ජයට කෙරුණි. වහලුන් ගෙන යන මුහුදු මාර්ගය වැටී තිබුණේ සැන්සිබාර් හරහා ය. එය සමෘධිමත් රටක් වූයේය.

මහා බ්‍රිතාන්‍යය යටතට පත්වූ පසු සැන්සිබාර් පාලනය සඳහා සුල්තාන්වරයෙකු පත්කරන ලදී. මෙ කියන යුද්ධය ඇතිවුණේ 1896 අගෝස්තු මස 27 වෙනි දාය. සැන්සිබාර් හි සුල්තාන්වරයා මියගිය විට ඒ වෙනුවට පත්වුණේ ඔහුගේ බෑනා වන කාලිඩ් බින් බර්ගාස් ය. ඔහු නොහික්මුණු අයෙකු වුවා මෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධියෙකු වීය. ඉදිරියට මතුවිය හැකි ව්‍යසන ගැන සිතා බ්‍රිතාන්‍ය රජය කාලිඩ් ට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළේය. ඉංග්‍රීසි නාවික හමුදාව ඈත මුහුදේ සිට අගෝස්තු 27 වෙනි දින උදයේ 9.02 ට ෂෙල් වෙඩි ප්‍රහාරයක් සැන්සිබාර් නැව් තොටට එල්ල කළාය. කාලිඩ් සතුව නැව් සේනාංකයක් නොවීය. තිබුණේ එකම නැවකි. ඉංග්‍රීසි ෂෙල් වෙඩි වලින් ඒ එකම නැව ගිලී යද්දී කාලිඩ් පැන ගියේය. මෙම ප්‍රහාරය විනාඩි 38 කින් නිම විය. මෙය ලොව මෙතෙක් සිදුවූ කෙටිම යුද්ධය ලෙස සැලකේ.




**ඉරිදා - SUN** මේ හුඟ කාලෙකට පස්සෙ තලවකැලේ නැන්දම්මා කතාකෙරුවා. දැන් රට හුඟාක් සාමකාමීය කිව්වා. ඒ ගමන් මේ එංගලන්තෙ ඉන්න අපිවත් නොදන්න ප්‍රවෘත්තියක් කිව්වා. කියලා හැබෑද කියලා මගෙන් ඇහුවා. දැන් ඇප්ඝනිස්ථානෙ යුද්ධෙ හන්දා හිරවෙලා අමාරුවෙ වැටිලා ඉන්න එංගලන්තෙ අගමැති ගෝඩ්න් බ්‍රවුන් ලංකාවෙ ජනාධිපති මහින්දගෙන් යුද්ධයක් දිනන හැටි කොහොමද කියලා උපදෙස් ඉල්ලුවලු. ඇත්තටම අපේ ජනාධිපතිත් එංගලන්තෙ අපිට කරපු කෙණහිලි අමතක කරලා නිහතමානීවම කිව්වලු, ගෝඩ්න් මගෙන් නෙවෙයි අපේ මලයා ගෝඨගෙනුයි, සරත් ගෙනුයි තමයි අහන්න ඕන කියලා. නැන්දම්මා කිව්වා දැක්ක නේද දුවේ දැන් ලංකාවට තියන තැන කියලා. ඊයෙත් බ්‍රිටිෂ් සෝල්ජර්ස්ලා අට දෙනෙක් කාබුල්වල මැරුණා.මේ යන විදියට බ්‍රවුන්ට ලංකාවෙන් උපදෙස් ගන්න වෙනවා

**සඳුදා - MON** ප්‍රභාකරන් අවුරුදු තිහක් ලංකාවේ අටවන්න හදලා බැරිවෙලා දැන් කස්ටියම වැලිගමත් ගිහිං ඉවරයි. එයාගේ කේ පී කියන ගෝලයෙක් ජාත්‍යන්තර ඊළමක් හදන්න යනවා. මෝඩ දෙමළ ඩයස්පෝරාව ආයි රවට්ටලා හොද්දක් හොයා ගන්න වැඩක් ඒ. ලෝකෙ කොයි රටේ හිටියත් ඒ රටේ ඉන්න අනෙක් ජනතාව එක්ක සමගියෙන් ඉන්න දන්නෙ නැති ජාතියක් හැටියටයි දැන් දෙමළ ජනතාව ලෝකෙ පිළිගන්නෙ. ඒ එක්කම තමන්ගෙ ජීවිතේ බේරගන්න තමන්ගෙම මිනිස්සුන්ට වෙඩි තියපු ජාතියක් ලෝකෙ පළමුවෙනි වතාවට මුලු ලෝකෙම දැක්කෙ මේ සැරේ උතුරෙ යුද්දෙදි.

**කුජදා - TUE** මේ දවස්වල පකිස්ථාන් ක්‍රිකට් කණ්ඩායම ඇවිත් ලංකාවේ ටෙස්ට් ගහනවා. අපේ චමින්ද වාස් මේ සැරේ තරඟවලට අරන් නැහැ. ඒ ගැන හිතේ අමාරුවෙන් වාස් පත්තරවලට ආඩපලි කියලා තිබුණා වාස් දක්ෂ පන්දු යවන්නෙක් පව හැබැව අපේ රටට ජයග්‍රහණය ගෙනදුන් කෙනෙක් බවත් ඇත්ත. ඒත් දැන් එයා අයින් වෙන්න කාලෙ හරි එහෙම නූන නම් අළුත් අය කණ්ඩායමට එන්නෙ කොහොමද? ඔය විදියට පරණ ක්‍රීඩකයො සේරම නාහෙන් අඩන්න ගත්තොත් අපි ඒ අයගෙ හොටු පිහදදා ඉන්නවා මිසක් කවදාවත් අපට දිනන්න හම්බ වෙන්නෙ නෑ. ලෝකෙ ස්වභාවය එහෙම තමයි. වාස් ඒ ඇත්ත තේරුම් ගන්න ඕන.

**බුදදා- WED** දැන් ලංකාවෙ ආයුර්වේදය කොච්චර දියුණුද කියනව නම් බටහිර රටවලින් ලංකාවෙ වෙද මහත්තුරු හම්බ වෙන්න හරියට ලෙඩ්ඩු එනවයි කියලා ආතර් මාමා කියනවා. සුද්දො දැන් හරියට කසාය බොනවලු. මුල්දි කට ඇඹුල් කළාට දැන් අගේට බොනවයි කියලා රත්මලානෙ වෙද මහත්තෙයෙක් මාමට කියලා. සුද්දන්ට අමාරුවක් නැතුව කසාය පොවන්න උපක්‍රමයක් හැටියට වෙද මහත්තෙයා නියම කරනවලු දවස් දෙක තුනක් සීනි නැතුව කහට තේ වතුර බොන්න කියලා. එහෙම බීලා මෙන්න දැන් සුද්දො ෂෝක් එකට තිත්ත නැතුව කසාය බොනවලු. ඔය විදියට ලන්ඩන් වලත් ළඟදිම බෙහෙත් සාප්පු අරින් ඇහැකිය කියලා වෙද මහත්තෙයා කිව්වලු.

**ගුරුදා - THU** මම පත්තරේක දැක්කා ජනතාවගෙන් ඉල්ලීමක්. අපේ රට දියුණු කරන්න අපේ ගුවන් සේවයෙන් ගමන් බිමන් යන්නය, වැටිලා තියන සංචාරක ව්‍යාපාරෙ දියුණු කරන්න එහෙම කරන්නය කියලා. කටුනායක වැඩ කරන අය කියන්නෙ ශ්‍රීලංකා ගුවන් සේවයෙ හැම දාම වගේ ක්ලබ් ක්ලාස් එකයි, බිස්නස් ක්ලාස් එකයි පිරෙන්න කිසි ලැජ්ජාවක් නැතුව මැති ඇමතිවරුන්ගෙ හාමිනේලා, නෑනලා, මස්සිනාලා බුරුතුපිටින් නොමිලේ යනවය, පිට කිසිම කෙනෙකුට යන්න ඉඩනැත. ඒහන්ද ලංකාවෙ ජනයා පිට ගුවන් සේවාවලින් තමන්ගෙ ගමන් බිමන් යනවය කියලා. ඉතින් කොහොමද අපේ සංචාරක ව්‍යාපාරෙ නගගන්නෙ? ඒක දවසින් දවස බහිනවා.

**කිවිදා- FRI** කොළඹ බණ්ඩාරනායක ශාලවෙ දැනට මාස තුනකට පෙර දැයට කිරුළ කියලා රජයේ ප්‍රදර්ශණයක් තිබුණා. හුඟක් සෙනග සහ පාසැල් ශිෂ්‍යයින් ආවා මේක නරඹන්න. මේ ප්‍රදර්ශණේට කොළඹ කටුගෙයින් ඉල්ලං ඇවිත් තිබුණා පැරණි වටිනා කඩුවකුයි, නටරාජාගේ පැරණි ප්‍රතිමාවකුයි. ප්‍රදර්ශණේ ඉවරවුණාමයි දන්නෙ අර කටුගෙයින් ගොනාපු කඩුවයි, ප්‍රතිමාවයි අතුරුදහන් වෙලා බව. කටුගෙයි කස්ටිය ඉල්ලනවා එහෙන් අරං ගිය බඩු ආපහු ගෙනැත් දෙන්න කියලා. මේකට සංස්කෘතික ඇමති වග කියන්න ඕනය කියලා පාර්ලිමේන්තුවේදි ජේවීපී මන්ත්‍රීවරු කිව්වට පස්සෙ දැන් ඒ ඇමති පාර්ලිමේන්තුවට එන්නෙ නැතුව කට් එක දානවා. සෝමතුංග බාප්ප මෙහෙම කතාවක් කිව්වා. ඇමති ඔපිස් එකෙන් කිව්වලු කඩුවක් ඕන යුද්දෙකට නේදැයි ඕක නැති වුණේ අර උතුරෙ යුද්දෙ ඉවර වෙන දවස්වලය. එහෙනම් කවුරු හරි කඩුව එහේ ගෙනියන්න ඇත. අනෙක, ප්‍රභාකරන්ගෙ ඔළුවෙ කඩුවකින් කොටපු පාරක් තියනවය. එහෙනම් ඕකෙන් තමයිය කොටන්න ඇත්තෙ. ඔය කඩුව මුලතිව් වල නන්දිකඩල් කළපුව හරියෙ කොහේහරි වැටිලා ඇත. කවුරු හරි ළඟදි අහුලල ගෙනැත් දේවිය, බයවෙන්න එපාය කියලා. අන්න ප්‍රශ්නෙ විසඳුවා. දැන් හරි නේ ?